# ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය
# தேசிய கொள்கைகள் மற்றும் பொருளாதார விவகாரங்கள் அமைச்சு
# MINISTRY OF NATIONAL POLICIES AND ECONOMIC AFFAIRS

"මිලෝදා" (පැරණි ටයිම්ස් ගොඩනැල්ල), පළමු මහළ, බ්‍රිස්ටල් වීදිය, කොළඹ 01. / 'மிலோதா', 1ம் மாடி,பிரிஸ்டல் வீதி,கொழும்பு 01./ "Miloda"(Old Times Building), 1st Floor, Bristol Street, Colombo 01.


| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல / My No: MNPEA/PLN/DCB/2017/Circular | ඔබේ අංකය / உமது இல / Your No: | දිනය / திகதி / Date: 2017/02/3 |

**චක්‍රලේඛ : MNPEA 04/2016 (ii)**

සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත,

<u>විමධ්‍යගත අයවැය වැඩසටහන - 2017</u>

2017 වර්ෂයේ විමධ්‍යගත අයවැය වැඩසටහන වෙනුවෙන් 2016.11.04 දින නිකුත්කළ **MNPEA 04/2016** චක්‍රලේඛය කෙරෙහි ඔබේ කාරුණික අවධානය යොමු කරනු කැමැත්තෙමි.

2. උක්ත චක්‍රලේඛයේ අංක 3.4 ඡේදය පහත සඳහන් පරිදි සංශෝධනය කෙරේ.

**3.4** රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලට අදාළව සියලුම කොන්ත්‍රාත්තු ක්‍රියාත්මක කළ යුතුය. එසේ උවද වටිනාකම රු. **500,000/-** ඉක්මවන ව්‍යාපෘති සඳහා සෘජු කොන්ත්‍රාත් ලබාදීමට අවසර නොමැත.

3. ඉහත චක්‍රලේඛයේ අනු අංක 1.11 සහ 2.8 ට අනුව, **ඇමුණුම් අංක 1** හි දක්වා ඇති අංශ / ක්ෂේත්‍රවලට අදාලව පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා විමධ්‍යගත අයවැය මුදල් වෙන් කල හැකිය. රැකියා අවස්ථා සඳහා ධාරිතාවය ප්‍රවර්ධනය කිරීම, ආදායම් ඉපයීම් පුළුල් කිරීම හා ඒ තුලින් ග්‍රාමීය අංශයේ අඩු ආදායම්ලාභී කාන්තාවන් හා තරුණ තරුණියන්ගේ දරිද්‍රතාවය පිටුදැකීම මෙහි අරමුණ වේ.

4. ඔබගේ දිස්ත්‍රික්කයේ සියළුම ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සහ ප්‍රාදේශීය / දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සමාජිකයන් හට මෙම ලිපිය දැන ගැනීමට සලස්වන්න.

**එම්.අයි.එම්. රෆීක්**
ලේකම්

පිටපත් -

1. ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් - ගරු අගමැතිතුමාගේ උපදෙස් අනුව ඔබගේ කාරුණික දැනගැනීම පිණිස හා අවශ්‍ය කටයුතු සඳහා
2. ලේකම්, මුදල් අමාත්‍යාංශය - කාරුණික දැනගැනීම පිණිස
3. ලේකම්, ස්වදේශ කටයුතු අමාත්‍යාංශය - කාරුණික දැනගැනීම පිණිස
4. ලේකම්, මහා නගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය - කරු. දැ.ගැ.ස සහ අ.ක.ස


දුරකථන / தொலைபேசி / Telephone: + 94 – 11- 2322867
ෆැක්ස් / தோலைநகல / Fax: + 94 – 11- 2339732, + 94 – 11- 2473643
විද්‍යුත් තැපැල / மின்னஞ்சல / E-mail: info@mppea.gov.lk
Website: www.mppea.gov.lk

5. ලේකම්, නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශය - කරු දැ.ගැ.ස සහ අ.ක.ස
6. ලේකම්, අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය - කරු දැ.ගැ.ස සහ අ.ක.ස
7. ලේකම්, බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචිකිරීම හා හින්දු ආගමික කටයුතු පිළිබඳ අමාත්‍යාංශය - කරු දැ.ගැ.ස සහ අ.ක.ස
8. ලේකම්, ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යාංශය - කරු දැ.ගැ.ස සහ අ.ක.ස
9. සියලුම පළාත් ප්‍රධාන ලේකම්වරුන් - කරු දැ.ගැ.ස
10. විගණකාධිපති, විගණකාධිපති දෙපාර්තමේනතුව - කරු දැ.ගැ.ස
11. අධ්‍යක්ෂ ජනරාල්, ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේනතුව - දැ.ගැ.ස සහ අ.ක.ස
12. අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අයවැය දෙපාර්තමේනතුව - දැ.ගැ.ස සහ අ.ක.ස
13. අධ්‍යක්ෂ ජනරාල්, ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව - දැ.ගැ.ස සහ අ.ක.ස
14. සියලුම දිස්ත්‍රික් ක්‍රමසම්පාදන අධ්‍යක්ෂවරු - අ.ක.ස - දැ.ගැ.ස සහ අ.ක.ස

# විමධ්‍යගත අයවැය වැඩසටහන 2017 යටතේ පුහුණු වැඩසටහන් පැවැත්වීම

**2016.11.04 දිනැති** MNPEA 04/2016 **චක්‍ර ලේඛයේ අනු අංක 1.11 හා 2.8 හා බැඳේ.**

විමධ්‍යගත අයවැය වැඩසටහන 2017 යටතේ පුහුණු වැඩසටහන් / පාඨමාලා පහත සඳහන් ක්ෂේත්‍ර / අංශවල පැවැත් වීම සඳහා ප්‍රතිපාදන වෙන් කල හැකිය.

1. **රැකියා අවස්ථා ඉලක්ක කරගත් පුහුණු වැඩසටහන් -**

   i. ඉදිකිරීම හා කාර්මික අංශවලට අදාල කාර්මික වාහන ක්‍රියා කර වීමේ / යාන්ත්‍ර ක්‍රියාකර වීමේ පුහුණුව
   ii. තොරතුරු තාක්ෂණ / චිත්‍රන සැලසුම්කරණ පාඨමාලා
   iii. මෝටර් කාර්මික පාඨමාලා
   iv. වඩුකාර්මික පුහුණු පාඨමාලා
   v. පරිගණක / ජංගම දුරකථන සහ අනෙකුත් විද්‍යුත් සහ ඉලෙක්ටොනික උපකරණ අලුත් වැඩියා කිරීමේ පාඨමාලා

   - එක් පාඨමාලාවක් සඳහා එක් ප්‍රතිලාභියකුට ලබාදෙන පාඨමාලා ගාස්තුව රු 20,000 නොඉක්මවිය යුතුය. පාඨමාලා ගාස්තුව අදාල පුහුණු පාඨමාලාව පවත්වන ආයතනයට සෘජුවම ගෙවිය යුතුය.

2. **ස්වයං රැකියා ඉලක්ක කරගත් වෘත්තීය පුහුණු පාඨමාලා**

   i. විසිතුරු මසුන් හා ජලජ පැලෑටි, මල් වැවීම, විසිතුරු ශාක සහ පලතුරු පැල කාර්මාන්තය
   ii. ජලනල කාර්මික, ඇලුමිනියම් වැඩ ආශ්‍රිත කටයුතු
   iii. කිරි ආශ්‍රිත නිෂ්පාදන, ආහාර නිෂ්පාදනය සහ සැකසීම
   iv. එළවළු , පලතුරු සහ කුළුබඩු ආශ්‍රිත අගය වැඩි කිරීමේ කටයුතු
   v. ඇඳුම් මැසීම - බිත්ති සැරසිලි දොර ජනෙල් රෙදි මැසීම හා සවිකිරීම, බිම් ඇතුරුම්, සෙල්ලම් බඩු සහ වෙනත් වෙළඳපල පාදක කරගත් නිර්මාණ
   vi. රූපලාවන්‍ය පාඨමාලා
   vii. නිශ්චිත ස්ථානයකට විශේෂිත වූ කාර්මාන්ත සඳහා වූ පාඨමාලා - එනම් මැටි කාර්මාන්තය, කොහු කර්මාන්තය, කිතුල් කර්මාන්තය, තල් කාර්මාන්තය සහ ඒ හා සමාන වෙනත් කර්මාන්ත.

   - එක් වැඩසටහනකට අවම වශයෙන් සඳහා 15 දෙනෙකු හෝ ඊට වැඩි පිරිසක් සහභාගී විය යුතුය. පාඨමාලාවට අවශ්‍ය ද්‍රව්‍ය ඇතුළු සම්පත් දායකයන්ගේ ගෙවීම් සඳහා එක් වැඩසටහනකට රුපියල් 100,000 ක් දක්වා ප්‍රතිපාදන වෙන් කල හැකිය.

## පොදු උපදෙස්

ඉහත විස්තර කරන ලද පුහුණු පාඨමාලා සඳහා වෙන් කරණු ලබන ප්‍රතිපාදන එක් ගරු මන්ත්‍රීවරයකුට වෙන්වන ප්‍රතිපාදනයෙන් සමාජ සුභසාධනය සඳහා වෙන් කර ඇති 30% ක උපරිම සීමාවක් යටතේ කල යුතුය. මෙම පුහුණු පාඨමාලා 2017 වර්ෂය තුල අවසන් කල යුතු බව ද අවධාරණය කරමි.